
**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**3.4 නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.**

**"ගී ගයමින් අපි රඟමු"**




දික්තල කාළගෝල නාට්‍ය මේ තරම් සාර්ථක නාට්‍යයක් බවට පරිවර්ථනය වීමට එහි සංගීත නිර්මාණයන් දැඩි බලපෑමක් එල්ල කොට ඇත. නාඩගම් ශෛලිය අදාළ මධුර ගීතාවලියකින් යුතු මෙම නාට්‍ය නැරඹීමේ දී එය ඔබට පැහැදිලි වන්නට ඇත.නිර්දිෂ්ට පෙළ නිසාවෙන් මෙම පෙළෙහි එන ගීත ගයමින් රැඟීමට ඇති විශයානුබද්ධ අවශ්‍යතාවය පසෙකින් තැබුව ද මෙම ගීත ගැයීමට මෙන් ම ගයමින් රැඟීමට යොමුවීම ඉතාමත් රසවත් කාර්යයකි.

නාට්‍ය ගීයක් ගැයීම සාමාන්‍ය සරල ගීයක් ගයනවාට වඩා තරමක් සංකීර්ණ කාර්යක් බව ඔබ දනී.ගීය ගයනවා වෙනුවට ගීය ගයමින් භාවයන් නිරූපණය කිරීමට අදාළ නලුවාට සිදුවෙයි.එබැවින් ඒ සඳහා මනා ප්‍රතිභාවක් මෙන්ම පුහුණුවක්ද අත්‍යාවශ්‍ය වෙයි. මනා හඬ පාලනයක් සහිතව , අවකාශ භාවිතය නිසි ආකාරව කළමණාකරණය කර ගනිමින් ,චරිතයට අදාළ නිරූපණය කිරීමට ඔබට පුහුණුවක් හා අත්වැලක් , අවස්ථාවක් ලබා දීම මෙම පාඩමෙහි අරමුණයි.

දික්තල කාළගෝල නාට්‍යයේ නාට්‍ය ගීත හා තවත් වේදිකා නාට්‍ය කිහිපයක නාට්‍ය ගීතයන් පහත සබැඳි හරහා සම්බන්ධ වීමෙන් ඔබට නැරඹීමට අවස්ථාව ඇත.

ඒ අනුව් අතිශය සජීවී වේදිකාවක ,සජීවී ප්‍රතිචාර මධ්‍යයේ තමාගේ භාවයන් ,හඬ හා නිරූපණයන් මනාව හසුරුවා ගනිමින් නලුවන් ගීත ගායනයේ යෙදෙන අයුරු නරඹා නාට්‍ය ගීත ගැයීමට උත්සහ දරන්න.

අපි ගමට යමු නාට්‍ය ගීතය

https://youtu.be/JF0dwQap8Mc

රතදර සිරියා පරදන නාට්‍ය ගීතය

https://youtu.be/JF0dwQap8Mc

ආලේ බැන්ද මාගේ රම්‍යවන් නාට්‍ය ගීතය

https://youtu.be/9MCqAdQio2k

විභාගේ විභාගේ නාට්‍ය ගීය ,විකෘති නාට්‍ය

https://youtu.be/wXl2j452V_8